**ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.6 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම්කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබෙන බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 විධිවිධානය** | | **ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි 128(1)- ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | | |
| මුදල් රෙගුලාසි 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.4 |
| | | 2. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.2 (අ) i |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2(අ) iii,iv,v 2.2(ආ) |
| | | 4. අනාර්ථික ගනුදෙනු | 2.2(අ) ii |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.5 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරිම/ ප්‍රමාද වී ඉදිරිපත් කිරිම | 2.1.1 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | කළමනාකරණ දූර්වලතා | 2.3 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 2.1 කාර්යසාධනය

-----------------

### 2.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 2 හි වාර්තා 2018 ඔක්තෝබර් 08 වන විටත් සභාගත කර නොතිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

------------------------------------------------------------

**ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

---------------------------------------

**(අ) මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශවීමේ ව්‍යාපෘතිය**

-----------------------------------------------

2016 දී ව්‍යාපෘතිය ආරම්භකර තිබූ අතර ඊට 2016 හා 2017 වර්ෂ වලදී රු.මිලියන 64 ක් ප්‍රතිපාදන ලබා දී තිබූ අතර ඉන් 62.25 ක් වැය කර තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සර්වර් යන්ත්‍රය මිලදී ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සමඟ 2016 දෙසැම්බර් 30 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එදිනම එම කාර්යය සඳහා රු. මිලියන 32.50 ක් ගෙවා තිබුණි. ගිවිසුමේ 4.3 වගන්තිය ප්‍රකාරව මාස 06 ක් ඇතුළත ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතු වුවත් 2017 සැප්තැම්බර් ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. එය පිරිවිතරවලට නොගැලපෙන බැවින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර 2018 ඔක්තෝබර් වන විටත් ප්‍රසම්පාදන කටයුතු නැවත සිදුකර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය සඳහා 2016 මැයි 15 සිට වර්ෂ දෙකක කාලයකට රු.මිලියන 0.17 ක මාසික කුලියට ලබාගෙන තිබුණද එය අදාළ කාර්යය සඳහා යොදවා නොගෙන ලිපිගොනු හා භාණ්ඩ ගබඩා කිරීම සඳහා යොදා ගෙන තිබුණි.

(iii) ව්‍යාපෘතිය යටතේ වෙළඳ ලකුණු ලියාපදිංචිය යාවත්කාලීන කිරීම හා බුද්ධිමය දේපල පනතට නීති සංශෝධනය කර ගැනීම සඳහා උපදේශන සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ සඳහා රු. මිලියන 7.8 ක් වැය කර තිබුණි. උපදේශන සේවා සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1, 2.4.1, 2.6.3, 2.8, 6.2 හා 7.1 වගන්තිවල විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(iv) 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම ලියාපදිංචි කර නොතිබුණි.

(v) මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශක 2017 මැයි 08 දින සිට 2017 ජුනි 07 දින දක්වා හා 2017 ජුනි 23 දින සිට සැප්තැම්බර් 26 දින දක්වා අඛණ්ඩව සේවයට වාර්තා කර නොතිබුණි.

(ආ) කාර්යාලය සඳහා බදු පදනම මත ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී ප්‍රසම්පාදන සැලැස්මට අනුව නියමිත කාලය තුල ප්‍රසම්පාදන කටයුතු අවසන් නොකිරීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.3, 2.7.4, 2.11.1, 2.12 , 5.3.13, 7.12.2 (අ), 7.12.4 අනුව කටයුතු කර නොතිබුණ අතර 2016 ජුනි 17 දිනැති අංක පීඑෆ්බී/ ජීඑම්බී/ සීඅයිආර්/ 2016/ 02 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත් මෙම ගොඩනැගිල්ල කාර්යාල අවශ්‍යතාවයට නොගැලපෙන හෙයින් නැවත මිල ගණන් කැඳවීමට තීරණය කර තිබුණි.

## 2.3 කළමනාකරණ දුර්වලතා

-----------------------

වෙළඳ ලකුණු සම්බන්ධව බුද්ධිමය දේපළ කාර්යාලට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් විවිධ හේතුන් මත පනවා තිබූ නඩු 163 ක් විය.

## 2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 20.93 | 12.90 | 8.03 | 38.37 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **20.93** | **12.90** | **8.03** | **38.37** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 17.24 | 15.70 | 1.54 | 8.93 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **17.24** | **15.70** | **1.54** | **8.93** |
| 2015 | පුනරාවර්තන | 25.87 | 25.28 | 0.59 | 2.28 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **25.87** | **25.28** | **0.59** | **2.28** |
| 2016 | පුනරාවර්තන | 28.75 | 28.15 | 0.60 | 2.09 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **28.75** | **28.15** | **0.60** | **2.09** |
| 2017 | පුනරාවර්තන | 30.88 | 30.73 | 0.15 | 0.49 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **30.88** | **30.73** | **0.15** | **0.49** |

සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රතිපාදන තාත්ත්විකව ඇස්තමේන්තු නොකිරීම නිසා වැය විෂයන් 03 සඳහා එකතුව රු.මිලියන1.58 ක පරිපූරක ප්‍රතිපාදන ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කාර්යාලයට අදාල විෂය අංක 29901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.00 | 3.99 | 1.50 | 2.50 | 12.00 | 8.82 |

## 2.6 මානව සම්පත් කළමනාකරණය

### 2.6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

කාර්යාලයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 30.44 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 06 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 66 | 43 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 14 | 01 |
| | **එකතුව** | **98** | **68** | **30** |

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 6 ක හා ද්විතියික මට්ටමේ තනතුරු 23 ක පුරප්පාඩු පැවතියද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල පුරප්පාඩු පිරවීමට නොහැකි වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂ 05 තුල පුහුණු කිරීමේ කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය සලකා බැලීමේදී 2013 වර්ෂයේදී ප්‍රතිපාදන උපයෝජනය සියයට 94 ක් ව පැවතියද, 2016 වන විට ක්‍රමයෙන් සියයට 56 දක්වා අඩුවී සමාලෝචිත වර්ෂයේදී එය සියයට 68 ක් වී තිබූ බව නිරීක්ෂණය විය.